# කස්තිරම

ඩී බී කුරුප්පු

# මසුරන් වටින කියමන් (තුනක්) දෙකක්

ගත වූ ඔක්තෝබර් මාසය තුළ ශ්‍රී ලාංකික හෝ ශ්‍රී ලාංකික ප්‍රභවයක් සහිත පුද්ගලයන් තුන් දෙනකුගේ එකිනෙකට වෙනස් එහෙත් වැදගත් ප්‍රකාශ තුනක් අසක්කට (කියවන්නට) ලැබුණෝ ය. ඒ තුනෙන් එකක් ගැන නම් මට එක්තරා කුහුලක් ඇත. සුප්‍රකට භික්ෂුන් වහන්සේ නමක් වන මාදුළුවාවේ සෝභිත හිමියන්ගේ ප්‍රකාශය උන්වහන්සේ මෑතක සිට අනුගමනය කරන ප්‍රතිපත්තියට අනුකූල වුව ද ඒ නිසාම එහි වලංගුභාවයම අඩුවන බව කිව යුතු ය. සමහර විට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීන් දෙදනකුට පමණක් සපුරා වැටහෙන හේතුවක් නිසා එජාපයට එරෙහිව වචනයක් කතා නොකරන උන්වහන්සේ ගේ ප්‍රකාශ සමහරක් ඒ පක්ෂයේම පන්සලක් හැටියට නම් දරා ඇති නාරාහේන්පිට පන්සලකදී හෝ එජාප ආධාරකරුවන් අතරදී කළ නිසාය ඒ.

එක සැරේකට තමා ඇතුළු භික්ෂූන් සිය නමක් හිරේට අරන් සරත් ෆොන්සේකා නිදහස් කරන්නැයි කී ඒ හාමුදුරුවෝ ඊ ගාවට මොන වරදක් කළත් රටට කළ සේවය සළකා ඔහු නිදහස් කරන්නයි ජනාධිපතිගෙන් ඉල්ලා සිටියහ. පළමු ප්‍රකාශයෙන් හෙළි වන්නේ නීතියක් ගැන මෙලෝ හසරක් නොදන්නා - නොතකන - ආධුනිකයකුගේ

*__ඔබතුමිය ඔය ප්‍රකාශය කරන්නේ වැරදි රටකදී.. ඕක කළ යුත්තේ එක්කෝ ඉරාකයේදී.. නැත්නම් ඇෆ්ඝනිස්ථානයේ දී.. ඒ දෙරටේ තමයි විදේශ හමුදා රිංගාගෙන අවුල් ඇති කරන්නේ..__*

බොළඳ කම ය. දෙවැන්න ඊට වඩා බැරෑරුම් එකකි. ප්‍රශ්නය වනුයේ මොන වරදක් කළත් යයි උන්වහන්සේ කියතත් ෆොන්සේකා හෝ




ඔහුගේ බිරිය හෝ ඔහු වරදක් කළ බව නොපිළිගැනීමයි. මෙන්න මේ හේතු නිසා මම උන්වහන්සේ ගේ ප්‍රකාශයට ඉහළ ලංසුවක් නොදෙන්නෙමි.

අනෙක් දෙදෙනාගේ ප්‍රකාශ ඊට වඩා අහුපෑවතක් සහිත - කොටින්ම මසුරන් වටින කියමන් ය.

ඉන් පළමුවැන්න ඩිලාන් පෙරේරා ඇමතිගේ ය. මා එතෙක් සිතාගෙන සිටියේ ඩිලාන් පෙරේරා විදේශ ඒන්ජීඕ කාරයන් හා සම්බන්ධතා තිබෙන බටහිරට ගැති දේශපාලකයකු හැටියට ය. එහෙත් ඔහුගේ කටේ මසුරන් දමන්නට හොඳ යයි මා නිගමනය කළ ප්‍රකාශය නිසා ඒ මතය සපුරා අතුරුදන් විය. ඔහු අමතක නොවන පාඩමක් කියා දුන්නේ බලවතුන්ගේ නියෝජිතයන් අප මව්බිම වැනි පුංචි රට වලට අවුත් මහ එවුන් වාගේ කටමැත දෙඩීමේ සිරිතට එල්ල කරන ලද මාරක ප්‍රහාරයක් ලෙසටය. ඇමරිකානු තානාපතිවරිය ඇගේ කාර්යාලයේ පැවැත්වූ සාදයකදී පැමිණ සිටි ශ්‍රී ලාංකික දේශපාලකයන්ට උගන්වන්නට තරම් පිම්බීමක් හිතට අරන් කතා කර ඇත. උතුරේ ජනතාව ගැන අනුකම්පාව පළ කළ ඇය කියා ඇත්තේ දැන් උතුරට අවශ්‍ය විදේශ හමුදා ඒ ප්‍රදේශයෙන් ඉවත් කර ගැනීම බවය. හීලෑ කරගන්නා ලද හුරතල් පැටවුන් වාගේ නිහඬව කට දල්වා ගෙන කන් දී ගෙන උන් ශ්‍රී ලාංකික නිවටයන් අතර සිටි එකම එඩිතර මිනිසා ඩිලාන් පෙරේරා බව පෙනෙයි. තානාපතිවරියට සුදුසු පාඩම ඔහු විසින් කියා දෙන ලද්දේ ලුණු ඇඹුල් ඇතිව ය.

"ඔබතුමිය ඔය ප්‍රකාශය කරන්නේ වැරදි රටකදී.. ඕක කළ යුත්තේ එක්කෝ ඉරාකයේදී.. නැත්නම් ඇෆ්ඝනිස්ථානයේ දී.. ඒ දෙරටේ තමයි විදේශ හමුදා රිංගාගෙන අවුල් ඇති කරන්නේ.. ශ්‍රී ලංකාවේ උතුරේ ඉන්නේ ශ්‍රී ලංකාවේම හමුදාව.. ඔවුන් අර ඇමරිකන් හමුදාව වාගේ දේශීය ජනයා ඝාතනය කරනවා නොවෙයි. උතුරේ ජනතාවට ඉන්න හිටින්න ගෙවල් දොරවල් හදලා ඔවුන්ට පහසුකම් සලසනවා"

පණ්ඩිතයන්ගෙත් කට වැහෙන අවස්ථා ඇත. ඩිලාන් පෙරේරා ගේ ප්‍රකාශයෙන් උදා වූයේ එබඳු විරල අවස්ථාවකි. කට මැත දෙඩූ තානාපතිනිය තුෂ්නිම්භූතව සවන් දුන්නා ය. අර කියාපු හීලෑ සත්තුන්ට පණ ආවේද ඉන් පසුව ය. ඔවුහු ඩිලාන් පෙරේරාට ස්තුති කරන්නට පටන් ගත්හ. ඒ ස්තුතිය වාසි පිලට හෝයියාවට වඩා දෙයක් නොවී ය.

මේ ප්‍රකාශය පිටුපස වූ ස්ථාවරය සහ එඩිතර කම අප මව්බිමේ දේශපාලකයන් බොහෝ දෙනෙකුගෙන් තුරන් ව ගොස් තිබුණු ලක්ෂණ ය. යටත් පිරිසෙයින් ඔවුන්ට මොළය පෑදෙන්නටවත් ඩිලාන් පෙරේරා ගේ කතාව කට පාඩම් කරගත යුතු බව කියමි.

අනෙක් ප්‍රකාශය ශ්‍රී ලංකා සම්භවයක් සහිත ඇමරිකානුවකුගේ ය. එයට නිසි ප්‍රචාරයක් ලැබුණා දැයි මම නොදනිමි. මේ පුද්ගලයා දෙමළ ජාතිකයෙකි. ඔහුගේ ප්‍රකාශයේ විශාල වැදගැම්මක් ඇත්තේ දෙමළ මිනිසකු මුවින් ගිළිහුණු නිසා ය. ඒ රටට ගිය ජනාධිපති මහින්ද රාජපක්ෂ මුණ ගැසුණු අවස්තාවක ඔහු කියා ඇත්තේ මෙබඳු කතාවකි.

"ඔබ දුටුගැමුණු කෙනෙක් විදියට හඳුන්වන එක හරි. මම දුටුගැමුණුට කැමතියි. ඔහු අපේ රටේ සමාජයට දියුණුවට වැඩ කරපු රජෙක්. ඔබත් ඒ වාගේම රට එකමුතු කරලා දියුණු කළ යුතුයි."

*(ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පිලිගැනීම පිණිස පසුගිය දා ඇමෙරිකාවේ හූස්ටන් නගරයේ පැවැති හමුවක දී ශ්‍රී ලාංකික දෙමළ නීතිවේදියකු වන ජෝර්ජ් ආර්. විලි විසින් පවත්වන ලද කතාව මෙහි වෙනම පළ වෙයි - සංස්කාරක)*

ඔහුගේ නම තිබුණා දැයි වත් මට මතක නැත. නමට වඩා වටින්නේ ඔහුගේ මසුරන් වටින වචන ය. ඒ වචන වුවත් සාමාන්‍ය දෙමළ මනුස්සයකුගේ මුවින් ගිළිහෙන විදියේ වදන් නොවෙයි. මා දැක ඇත්තේ සිංහල දේශප්‍රේමීන් පවා දුටුගැමුණු දෙමළුන් පෙති ගැසූ වීරයකු ලෙසින් උහා තබන ආකාරයයි. ඔහු රට සමගි කළ රටේ සකල විධ ජනතාවට එක සේ සලකා කටයුතු කළ සාධාරණ පාලකයකු වශයෙන් සිහිපත් කරන්නේ කීයෙන් කී දෙනා ද?

යට කී දෙමළ ජාතිකයා විසින් පටු සිංහල ජාති ප්‍රේමීන්ගේ කම්මුලට එල්ල කරන ලද්දේ අමතක නොවන අතුල් පහරකි. ඒ පාර කාගෙනවත් දුටු ගැමුණු පිළිබඳ නව ප්‍රවේශයත් - නව ආකල්පයක් - ඇති කර ගෙන ජාතික සමගිය ගොඩ නැංවීමෙහි ලා දුටු ගැමුණු රජු ආදර්ශයක් කර ගන්නට සිතනු ඇද්ද.? ඒ අතුල් පහර එහෙම සිතන්නට අදිමදි කරන නිදිමත කාරයන්ටය. නිදිමතේ හරි ඒ පහර කාගෙන අවදි වී වට පිට නෙත් යොමන්නට ශ්‍රී ලංකාවේ ජාතිප්‍රේමීන් පුරුදු වුණොත් අනාගතය දැනට වඩා බලාපොරොත්තු සහගත වූත් - සමගි සම්පන්න ජනතාවකට වාස භූමිය වූත් සුන්දර දේශයක් බවට පරිවර්තන වීම (නොහොත් කිරීම) ප්‍රාතිහාර්යයක් නොවනු ඇත. ප්‍රාතිහාර්යයක් වුවත් එය සිදුවනු ඇතැයි දුර සිට පතන්නට මම කැමැත්තෙමි. ■

# අප යළි පාරාදීසයට කැඳවා යන්න.

***ජනාධිපති රාජපක්ෂ මහතා පිලිගැනීම පිණිස පසුගිය දා ඇමෙරිකාවේ හූස්ටන් නගරයේ පැවැති හමුවක දී ශ්‍රී ලාංකික දෙමළ නීතිවේදියකු වන ජෝර්ජ් ආර්. විලි විසින් පවත්වන ලද කතාව.***

අතිගරු ජනාධිපතිතුමනි,

මා ඉපදුනේ ලංකාවේ ය. මගේ මුතුන් මිත්තෝ සියල්ලෝම නිදන්නේ අපේ දේශයේ ශුද්ධ වූ පොලවෙහි ය. වයස දහයක් වෙත්ම මම යාපනයේ සිට කොළඹට ආවෙමි.

යාපනයේ අඹ පැනිරස මම උරා බී ඇත්තේමි. කොළඹ දී රසවත් රතු ජම්මු මගේ කමීසයෙහි රතු පැල්ලම් ඉතිරි කළේ ය. කපුටන් හාරා ගන්නට තැත් දරන ඉදීගෙන එන වරකා සුවඳ මට පුරුදු ය.

මා රට හැර ආවේ 1975 දී ය. එකල් සිට අපේ දේශය වෙලී ඇත්තේ ඒ සා මහත් වූ වේදනාවකින්, දුක්ගින්දරකින් සහ සන්තාපයකිනි. කුඹුරු යාය වෙත සිය ශුද්ධ වූ ජලය ගෙන එන්නා වූ බලවන්ත මහවැලි නදිය උතුරුවාලූයේ ලේ ය. දෙමළුන්ගේත් සිහලුන්ගේත් ලේ ය.

අපේ දේශය පාරාදීසයක සිට නරකාදිය කරා පතුලට ම ගිලී යනු මම බලා සිටියෙමි. වරද කාගේ දැයි සහතික කර කීමට කිසිවකුට නොහැකි ය. මන්ද වරද සෙවිය යුතු කාලය බොහෝ ඉක්ම ගොස් ඇති බැවිනි.

අතිගරු ජනාධිපතිතුමනි, ඔබ සමහර විට පැවැත එන්නේ දුටු ගැමුණුගෙන් විය හැකි ය. අපේ ජනයා පැවැත එන්නේ, එනයින් එළාරගෙනි. මතකයට ගන්න, කණ්ඩුල නම් සිය ඇතුපිට නැගී දුටු ගැමුණු එළාර සමග යුද වැදුණු සැටි. ප්‍රථම වතාවට ශ්‍රී ලංකාව එකසේසත් කිරීම උදෙසා තවමත් දුටු ගැමුණු අනුස්මරණය කැරේ. එමෙන්ම ඔහු තවත් කරුණක් නිසා ද අනුස්මරණය කෙරෙයි. යුද වැදී එළාර මරා දැමීමෙන් පසු ඔහු එළාර වෙනුවෙන් ස්මාරකයක් තැනව්වේ ය. ඒ ගරුකළ යුතු සිය සතුරා වෙනුවෙනි.

*__ජනාධිපතිතුමනි, ඔබ මේ ලස්සන නගරයෙන් ආපසු යන විට මට පොරොන්දු වෙන්න හෙට දවසේ පාසැලට යන දස හැවිරිදි දරුවාගේ සුදු කමීසයෙහි ජම්බු රත මිස අන් රතු පැල්ලමක් නොතිබෙන බවට.__*

එතැන නතර වී බැස අචාර කරන ලෙස ඔහු සියළු ශ්‍රී ලාංකිකයිනට නියෝග කලේ ය. එමගින් ඔහු පෙන්නුම් කලේ සිය උදාරත්වය පමණක් නොවේ. තමා දක්ෂ දේශපාලනඥයකු ද වන බව ය. එළාරපරාජය කිරීමෙන් පසු තමාට දෙමළ ජනයා පාලනය කිරීමට ඇති බව ඔහු දැන සිටියේ ය.

ජනාධිපතිතුමනි, ඇදහීම සහ වාසනාව ද ඔබේ ඉහළ දේශපාලන නිපුණතා ද විසින් ඔබ ඉතිහාසයේ අද්විතීය තැනක තබනු ලැබ ඇත. තමාට පෙර අන් අය අසාර්ථක වූ නමුත් මහින්ද රාජපක්ෂ නම් ශ්‍රේෂ්ඨ නායකයා සහ දක්ෂ යුදකාමියා විසින් විසිපස් වසරක් පැවැති කැරලිකාරිත්වය අවසානයේ දී පරාජය කළ බව ඉදිරි දරු පරම්පරා ඉගෙන ගන්නවා ඇත. විටෙක ඔබ විසි එක්වන සියවසේ දුටු ගැමුණු යැයිද ඔවුන් විසින් නම් කරන්නට ඉඩ තිබේ.

එසේ නමුත් ජනාධිපතිතුමනි ඔබට දුටු ගැමුණු චෛතසිකය පැලඳ ගැනීමට අවැසි නම් ඔබ ද තැනිය යුතු ය ස්මාරකයක්. එය නොවිය යුතු ය දාගැබක් හෝ ගොඩනැගිල්ලක්. එය විය යුතු ය නව පිලිවෙතක්. එය පිරිපුන් විය යුතු ය ක්‍රියාත්මක වීමට අවශ්‍ය බලයෙන්. 1958 වර්ගවාදී කැරලි කෝලාහලයන්ට මඟ පෑදූ වැරදි වලට යලි ඉඩ නොතියන්න. සරසවි වරම් ලැබීමට අපේක්ෂාවෙන් සිටින දෙමළ තරුණ තරුණියන් නොවළකන්න. තමන් දෙවන පංතියේ පුරවැසියන් යැයි දෙමළ ජනයාට හැඟෙන්නට ඉඩ නොහරින්න. ඔවුන්ගේ ආගමට ඔවුන්ගේ භාෂාවට ගරු කරන්න.